**ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

**----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**----------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

------------------------

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | --------------------------------- |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ජංගම නොවන වත්කම් ප්‍රකාශය හා සිගාස් වැඩසටහන තුළ වූ ස්ථාවර වත්කම් මොඩියුලයේ ඇති මෝටර් රථ සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ ශේෂ අතර පිළිවෙළින් රු.205,000 ක සහ රු.31,873,443 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා සිගාස් වැඩසටහන අනුව පවතින ශේෂවල වෙනස් කම් සැසඳීමට කටයුතු කළ යුතු වීම. | මෙම වෙනස පවතින්නේ 2004 වර්ෂයේ සිට පිළියෙල කරන ලද ජංගම නොවන වත්කම් ලේඛනයේ ශේෂය සහ සිගැස් වැඩසටහනට ඇතුළත් කරන ලද ශේෂය අතරයි. මේ වන විට සිගැස් වැඩසටහන හා ජංගම නොවන වත්කම් ලේඛනයේ ශේෂ සැසඳීම් සිදුකරගෙන යනු ලබන අතර හැකි ඉක්මනින් එය අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | ජංගම නොවන වත්කම් තුළ විදේශාධාර ව්‍යාපෘති වියදම් රු.1,139,259 ක් ඇතුළත් කර තිබුණි. | ජංගම නොවන වත්කම් හා විදේශාධාර වෙන් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. | විදේශාධාර ලෙස රු.1,139,259 ක ශේෂයක් සලකා ඇත. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව රු.20,975,201,524 ක ස්ථාවර වත්කම් වාර්තා කර තිබුණද, මහ භාණ්ඩාගාර නව සිගාස් මොඩියුලයට අනුව 160 ශීර්ෂය යටතේ රු.20,954,342,526 ක වත්කම් නිරික්ෂණය | භාණ්ඩාගාරයේ පොත් හා සැසඳීම් සිදුකර වෙනස නිවැරදි කළ යුතු වීම. | මේ වන විට රු.20,858,998 ක ප්‍රමාණයක ශේෂයක් නව සිගැස් වැඩසටහනට ඇතුළත්ව ඇත. සිගැස් වැඩසටහනේ පැවති තාක්ෂණ දෝෂයන් හේතුවෙන් මහවැලි අංශයේ (Sub office) ශේෂය මේ දක්වා ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. රාජ්‍ය ගිණුම් |

| | | |
|---|---|---|
| නොවුණි. | | දෙපාර්තමේන්තුවේ නිලධාරින් මේ පිළිබඳව දැනුවත් කර ඇති අතර ඉතා ඉක්මනින්ම එය නිවැරදි කරගත හැකිය. |

### 1.6.2 අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණය සිදුකෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 7002/0000/00/0323/0017/000 දරන ගිණුමට අදාලව 2007 වර්ෂයේ සිට පැවත එන රු.260,361 ක නොපිය වූ අත්තිකාරම් ශේෂයක් විය. | නොපියවූ අත්තිකාරම් පිළිබඳ සොයා බලා පියවීමට කටයුතු කළ යුතු වීම. | මෙම අත්තිකාරම් පියවා ගැනීම සඳහා පොලීසියට පැමිණිල්ලක් සිදුකර ඇති අතර, එම මුදල අයකර ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බඩු ලේඛන පොත | | |
| මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව බඩු ලේඛන පොතක් පවත්වා නොතිබුණි. (Inventory Book) | මුදල් රෙගුලාසි 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොතක් යාවත්කාලින කර පවත්වා ගත යුතුය. | බඩු ලේඛන පොතක් පවත්වාගෙන ගොස් ඇත. |
| (ආ) හානි පිළිබඳ ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් | අමාත්‍යාංශය යටතේ හානි පාඩු වාර්තාවී නොමැති බැවින් හානි පාඩු ලේඛනය යාවත්කාලීන වී නොමැත. |

යාවත්කාලීනව
පවත්වාගත යුතුය.

### 1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික විම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති එලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබාදී නොමැත. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | | | |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් රෙගුලාසි සංග්‍රහය ------------------------ | | | |
| i. | මුදල් රෙගුලාසි 753 | පරිසර අංශයේ ඉන්වෙන්ට්‍රිගත නොවූ විෂයයන් 1070 ක් තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව එම විෂයයන් ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයට උපදෙස් ලබාදී ඇති අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් එම වාර්තාව ලබාදුන් වහාම ඒ පිළිබඳව විගණනයට වාර්තා කරන බව දන්වා සිටිමි. |
| ii. | මුදල් රෙගුලාසි 758 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වත්කම්වල අතිරික්තතා හා ඌනතා වශයෙන් පිළිවෙලින් විෂයයන් 260 ක් හා 190 ක් පැවතුණද ඒ සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඌනතා හා අතිරික්තතා පිළිබඳව කටයුතු කළ යුතු බව. | මේ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයට උපදෙස් ලබාදී ඇති අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් එම වාර්තාව ලබාදුන් වහාම ඒ පිළිබඳව විගණනයට වාර්තා කරන බව දන්වා සිටිමි. |
| iii. | මුදල් රෙගුලාසි 804 හා 753 | අමාත්‍යාංශය නව ගොඩනැගිල්ලට පිවිසීමේදී පැරණි ගොඩනැගිලි පරිශ්‍රයේ වූ වත්කම් රජයේ වෙනත් ආයතනවලට ලබාදී තිබුණ ද ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි අදාළ ලේඛන පවත්වාගත යුතු වීම. | වෙනත් ආයතනවලට ලබාදුන් අයිතම සඳහා නිකුත් කිරීමේ නියෝග ලබාදී ඇති අතර, ඒ සඳහා ලැබීම් නියෝග ආයතන කිහිපයකින් තවදුරටත් ලැබිය යුතුව ඇත. |
| (ආ) | 2018 නොවැම්බර් 05 දිනැති අංක 06/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 01 ඡේදය | අංක 0007040898 දරන බැංකු ගිණුම සඳහා පවත්වා තිබුණු මුදල් පොතේ 2018 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය පියවීමේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර | චක්‍රලේඛය ප්‍රකාරව ගැලපුම් ගිණුම පිළියෙල කර ඉදිරිපත් කළ යුතු බව. | සියළුම ගිණුම්වල ශේෂයන් නිවැරදිව පියවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණි. | | |
| (ඇ) | 2018 ඔක්තෝබර් 19 දිනැති අංක 266/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.11 ඡේදය | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා නොකරන ලද කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2019 වර්ෂය තුළ නිරවුල් නොකළ යුතු බව සඳහන් වුවද, එසේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා නොකරන ලද රු.1,103,666 ක බැරකම් 2019 වර්ෂය තුළ නිරවුල් කර තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 දෙසැම්බර් 31 දිනට ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ එහෙත් 2019 වර්ෂය ආරම්භයේ ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලද වවුචර් වේ. |
| (ඈ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව අක් මුදල් ගැලපීම් ගිණුමක් පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් ගැලපීම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ අග්‍රිම ගැලපුම් ගිණුමක් ඉදිරිපත් කළ යුතු බව. | 2019 අප්‍රේල් 29 දින ඉදිරිපත් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව මූලධන ප්‍රතිපාදන සලසාගෙන තිබීම හේතුවෙන් රු.මිලියන 5,557.64 ක් හෙවත් සියයට 99.32 ක් ම ඉතිරිවී තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනවලින් වැය විෂයයන් 04 ක් වෙනුවෙන් සලසා තිබුණු රු.මිලයන 05 ක මූලධන ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී තිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන නිවැරදිව ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය. | අමාත්‍ය කාර්යාලය සහ රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සඳහා වෙන්වී තිබූ ප්‍රතිපාදන වියදම් නොවීමට හේතු වූයේ ගොඩනැගිල්ලේ හා යන්ත්‍රෝපකරණවල අළුත්වැඩියා අවශ්‍යතාවයන් ඇති නොවූ බැවිනි. මාදුරු ඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වෙන් වී තිබූ රුපියල් මිලියන 5 ක මුදල ප්‍රායෝගික හේතු මත ව්‍යාපෘතියේ මූලික කටයුතු අවසන් නොවීම නිසා ඉතිරි විය. |
| (ආ) | අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව ප්‍රතිපාදන වෙන්කිරීම හා සැලසුම් කළ පරිදි කටයුතු සිදු නොකිරීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 10 ක් වෙත වෙන්කර තිබුණු මුළු එකතුව රු. මිලියන 2,946.87 ක් වූ ප්‍රතිපාදන අතරින් එකතුව රු. මිලියන 1,250.9 ක් හෙවත් සියයට 23 සිට සියයට 74 අතර දක්වා වූ පරාසයක ඉතිරිවීම් පැවතුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම | අක් මුදල් ලබා නොදීම්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ප්‍රායෝගික ගැටළු හා නව උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් නොවීම වැනි නොවැලැක්විය හැකි හේතු නිසා මෙම ඉතිරි වීම් ඇතිවී තිබේ. |
| (ඇ) | අයවැය ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙළ නොකිරීම නිසා මූලධන වැය විෂයයන් 03 ක් වෙත මාරුකර තිබුණු රු.මිලියන 4,000 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 2,262.58 ක් හෙවත් සියයට 23 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී එක් මූලධන වැය විෂයයක් සඳහා ලබාගන්නා ලද පරිපූරක ප්‍රතිපාදන රු.මිලියන 257 ක් මුළුමනින්ම ඉතිරි වී තිබුණි. තවත් වැය විෂයයන් 02 ක් සඳහා ලබාගන්නා ලද පරිපූරක ප්‍රතිපාදන රු.මිලියන 27.16 කින් සියයට 38 ක සහ සියයට 86 ක ඉතිරි කිරීම් පැවතුණි. | පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන නිවැරදිව ප්‍රතිපාදන ලබාගත යුතුවීම. | -එම- |
| (ඉ) | වේලිඔය ජලාධාර ප්‍රදේශ කළමනාකරණය සඳහා සැලැස්මක් සැකසීමේ වැඩසටහනේ අවසන් අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ මධ්‍යම පරිසර අධිකාරිය විසින් මාස 10 ක කාලයක් සඳහා රු.මිලියන1.3 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. 2016 ජූලි 14 දින මෙම ගිවිසුමට එළඹ තිබුණද, 2019 විගණිත දින වන විටත් ඊට අදාළ සමෝධානික ඉඩම් පරිහරණ කලාප සිතියම් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාර්ය නියමිත පරිදි කාල වකවානුව තුළ සිදුකර අදාල කටයුතු නිමකිරීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------ | ----------- | ------------------------------ |
| (අ) | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් මිස | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ගමන් වියදම් සහ අතිකාල සඳහා මෙම ගෙවීම් සිදුකර ඇති අතර, මෙවැනි වියදම් සඳහා ප්‍රතිපාදන සීමාව තුළ |

| | | | |
|---|---|---|---|
| | වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට එකඟ නොවිය යුතු නමුත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.213,730 ක බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | | වියදම් දැරීම උපරිම වශයෙන් කළමනාකරණය කලද ඇති වන ප්‍රායෝගික තත්ත්වයන් තුළ මෙම ගෙවීම් සිදුකර ඇත. |
| (ආ) | 2018 වර්ෂයට අදාළව 2019 පෙබරවාරි 26 දින ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවන ලද රු.137,925 ක මුදල විසර්ජන ගිණුමේ සටහන් iv හි ඇතුළත් කර නොතිබුණි. | බැරකම් ලේඛනයට සියළුම බැරකම් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවීම. | විසර්ජන ගිණුම් සඳහා 2019 පෙබරවාරි 25 දින දක්වා ගිණුම් අංශය ඉදිරිපත් කරන ලද ගෙවීම් ලේඛන පදනම් කරගෙන බැරකම් ලේඛනයක් සකස් කර ඇත. නමුත් මෙම වවුචරය එදිනට පසු ගිණුම් අංශයට ඉදිරිපත් වූ බැවින් බැරකම් ලේඛනයට ඇතුළත් වී නොමැත. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලංකා බැංකුවේ අංක 7040482 හා අංක 7040979 දරන බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ වූ බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ ඇතුළත් කර නොතිබූ අතර බැංකු ගිණුම් පියවා ඇත්නම් ඒ බවට බැංකුවෙන් ලබාගත් ශේෂ තහවුරුවක්ද ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම බැංකු ගිණුම් පිළිබඳව ද තොරතුරු තත්ත්ව වාර්තාවට ඇතුළත් කළ යුතුවීම. | අතපසු වීමකින් තත්ත්ව වාර්තාවට ඇතුළත් කිරීම මගහැරී ඇත. |
| (ආ) | ලංකා බැංකුවේ අංක 0007040911 දරන බැංකු ගිණුම සඳහා 2018 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2018 | සියළුම බැංකු වලින් ලද ලැබීම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුවීම. | 2018 දෙසැම්බර් 24 දින වන විට මෙම මුදල අදාල ව්‍යාපෘතියේ හඳුනා නොගත් ලැබීමක් වූ අතර, එය පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර, අදාල ව්‍යාපෘතියෙන් පසුව |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 24 දිනැති අංක SRE 483530 දරන රු.7,167,900 ක් වටිනා හඳුනා නොගත් ලැබීම් විගණිත දිනය වන විටද හඳුනාගෙන නොතිබුණි. | | තොරතුරු ලබාගෙන නිසි පරිදි 2019 මාර්තු 11 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීම සඳහා යොමුකර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහජනතාවගේ සහ ආර්ථිකයේ යහපැවැත්ම පිණිස ස්වභාවික පරිසරයේ තිරසාර කිරීමෙන් සෞඛ්‍යමය හා ප්‍රසන්න පරිසරයක් යන දැක්ම සහිතව ක්‍රියාත්මක වන පරිසර අමාත්‍යාංශය යටතේ සියළු පාර්ශවයන් දායකත්වය සහිතව අපද්‍රව්‍ය කළමනාකරණ සිදු කරවීම සඳහා මහා යාන්ත්‍රණයක් ගොඩනැංවීමේ අවශ්‍යතාවය මේ වන විට උද්ගත වී ඇත. මෙසේ පාරිසරික ගැටළු ඇතිවන ක්ෂේත්‍ර හඳුනාගැනීම සඳහා අවධානම් ඇගයීම් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් අනුගමනය කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | අවදානම් ඇගයීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ----------- | -------------------------------- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව මැදිරිගිරිය හා ලංකාපුර කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීමට තිබූ උප ව්‍යාපෘති පහක්, නව ඇස්තමේන්තු සකස් කිරීම හා නිර්ණායකයන්ට අනුකූල නොවන බව දක්වමින් ක්‍රියාත්මක කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ----------- | -------------------------------- |
| ගම්පහ දිස්ත්‍රික් ඒකාබද්ධ කසල කළමනාකරණ ව්‍යාපෘතියේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා අමතර ගොඩනැලිල්ල ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේදී රු.76,512,353 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. මේ සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ 2018 ජනවාරි 29 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර දින 180 ක් ඇතුළත මෙම ඉදිකිරීම නිම කළ යුතු වුවද, විගණිත දිනය වන 2019 අප්‍රේල් වන විටත් අදාල කාර්යයන් අවසන් වී නොතිබුණි | නියමිත පරිදි අදාල ඉදිකිරීම් නිම කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |

.

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පද්ධති තුළ කෘෂි ජීවනෝපායන් වැඩිදියුණු කිරීම හා දේශගුණික විපර්යාස බලපෑම්වලට අනුගත කිරීම සඳහා කෘෂි ජෛව විවිධත්වය සංරක්ෂණය හා භාවිතය අනුප්‍රවාහගත කිරීමේ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 31 දිනට අවසන් වීමට නියමිතව තිබුණි. එහෙත් අපේක්ෂිත නිමැවුම් සහ ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකිවීමෙන් ව්‍යාපෘතියේ කාල සීමාව 2019 නොවැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. | නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කර අපේක්ෂිත අරමුණු ඉටු කරවා ගත යුතුවීම. | අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කර ඇත. |
| (ආ) | මානව පෝෂණය හා යහපැවැත්ම දියුණු කිරීම සඳහා ජෛව විවිධත්තව සංරක්ෂණය හා තිරසර භාවිතය අනුප්‍රවහගත කිරීමේ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වීමට නියමිතව තිබුණද අපේක්ෂිත නිමැවුම් සහ ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතියේ කාලසීමාව 2018 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පරිසර මාවත වැඩසටහන 2017 වර්ෂයෙන් පසුව ඉදිරියට ගෙනයාමට අපොහොසත්වීම | අදාළ කාර්යය නිම කිරීමට අවශ්‍ය විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සලකා බැලිය යුතුවීම | ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අදාළ වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යෑමට අවස්ථාව නොලැබුණි. |

හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා ළගා වීමට නොහැකි වී තිබුණි.

## 3.5 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ මහවැලි ගංගා ද්‍රෝණිය ආශ්‍රිතව මැදිරිගිරිය, ලංකාපුර හා වලපනේ යන ප්‍රදේශවල ඇති ගොවි ජනපදවල වෙසෙන කෘෂිකාර්මික ප්‍රජාව දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම්වලට අනුහුරු කරවීම සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සියයට 52 ක අවම මට්ටමක පැවතුණි. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි කාර්යසාධනයන් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. | ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 250 ක මුදලක් වෙන්කර තිබූ අතර මෙම ව්‍යාපෘතියේ නිලධාරීන් ඉවත්ව යාම හා අලුතින් බඳවා ගැනීම් අදාල වර්ෂය තුළ සිදුවූ බැවින් ව්‍යාපෘති කටයුතු සිදුකිරීම ප්‍රමාදයට හේතුවිය. |
| (ආ) | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සියළුම ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම හෝ නිම කිරීම නියමිත කාල රාමුව තුළ සිදුකිරීමට නොහැකි වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ ලබාදීමට කඩිනම් කළ යුතු වීම හා ඉදිරි ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුවීම. | ප්‍රධාන උමගෙයි ඇති වූ විශාල ජලකාන්දුව පිළිසකර කිරීමට කාලය ගත වූ බැවින් මුලින් සැලසුම් කරන ලද කාලයට වඩා වැඩි කාලයක් ගතවීම නිසා ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීමට හේතු වී ඇත. |
| (ඇ) | පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘතිය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලද වාර්ෂික ප්‍රතිපාදනයෙන් වනරෝපා ජාතික රුක්රෝපන වැඩසටහනට සමගාමීව මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමෝපායක් ලෙස | අදාල කටයුතු ගිවිසුම අනුව නියමිත පරිදි අදාල කාල වකවානුව තුළ සිදුකර අපේක්ෂිත අරමුණු කරා ළඟා විය යුතු බව. | වනරෝපා ජාතික රුක්රෝපන වැඩසටහනේ විකාශනය සඳහා සුදුසු තත්ත්වයේ පවතින රූපවාහිනී වැඩසටහන් 08 ක් මේ වන විට නිෂ්පාදනය කර ඇත. එම එක් වැඩසටහනකට රු.මිලියන 5.4 ක නිෂ්පාදන වියදමක් පමණක් දරා ඇති අතර අවශ්‍ය ප්‍රතිපාදන සොයා ගැනීමෙන් අනතුරුව වැඩසටහන ප්‍රචාරය කිරීමට කටයුතු සූදානම් |

| | |
|---|---|
| සකස්කරන ලද රුක්රෝපන වැඩසටහන නිෂ්පාදනය කර විකාශනය කිරීම සඳහා රු.මිලියන 5.4 ක මුදලක් ගෙවා තිබුණද එම වැඩසටහන් මේ වන තෙක් විකාශනය කර නොතිබුණි. | කර ඇත. |

**3.6 ප්‍රසම්පාදනයන්**

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ----------- | ---------------------------------- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 33 න් බැහැරව හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා වටිනාකම රු.454,000 ක් වූ පරිගණක යන්ත්‍ර 04 ක් මිලදීගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී අදාල මාර්ගෝපදේශ අනුව කටයුතු කරන බව |

**3.7 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ------------- | ---------------------------------- |
| (අ) අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ල ඉදිකර වසර 1 ½ පමණ ගතවී තිබුණද ඊට අදාල ප්‍රමාණපත්‍ර රේට් අනුමත කර නොතිබුණි. එසේ තිබියදීත් ඇස්තමේන්තු වටිනාකමින් සියයට 88 ක් එනම් රු. මිලියන 991.22 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් සම්බන්ධ ප්‍රමාණපත්‍ර සඳහා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සිදුව ඇති ප්‍රමාදයන් වලක්වා ගැනීම අමාත්‍යාංශයට පාලනය කර ගත නොහැකි කරුණක් බව දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශයේ පරිසර අංශයට අයත් වාහන 02 ක් වසර 06 ත් 11 ක කාලයක් නිෂ්ක්‍රියව පැවති අතර ඒවා අළුත්වැඩියා කර පාවිච්චි කිරීමට හෝ අපහරණය කිරීම සඳහා කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | භාවිතයට ගත හැකි වත්කම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ සුදුසු පරිදි අපහරණය කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ලද ජීප් රථයක් විධිමත්ව පවරා දී නොතිබුණි. | විධිමත්ව පවරාදීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඈ) | අළුත්වැඩියා කර ධාවනයේ යෙදවිය හැකි තත්ත්වයේ පවතින වාහන 08 ක් මාස 02 සිට අවුරුදු 06 ක කාලයක් ධාවනයේ යොදවා නොතිබුණි. | අළුත්වැඩියා කළ යුතු වාහන අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඉ) | මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වෙනත් ආයතන 06 කින් ලබාගෙන ඇති වාහන 14 ක් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත්ව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වී ම. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.8** **අනාර්ථික ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ----------- | ---------------------------- |
| රාජ්‍ය ආයතනවල ඉදිකිරීම් හරිතකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දීම සඳහා රු.2,967,777 ක් වැය කර තිබූ අතර ඉන් රු.1,814,684 ක් මාර්ගෝපදේශ සංග්‍රහය එළි දැක්වීමේ උත්සවය සඳහා ද රු.1,153,093 ක් රාජ්‍ය ආයතන දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහාද වැය කර තිබුණි. | වියදම් නියමිත පරිදි කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.9** **කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------ | ----------- | --------------------------------- |
| (අ) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර එය ප්‍රතිපත්තිවලට පමණක් සීමා වී තිබුණි. | අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කර නිවැරදිව අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතු වීම. | ප්‍රතිපත්ති සකස් කිරීම මේ වන විට ආරම්භ කර ඇති අතර රාජ්‍ය ගිණුම් කාරක සභාවෙන් ද විමසීම් කර තිබුණි. එමෙන්ම අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකර ඇති අතර එම ප්‍රතිපත්තියේ කොටසක් ලෙස විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය ද ඇතුළත් බව දන්වා සිටිමි. |